## 1.33 නූතනත්වය හා ලෝරන්ස්

නලින් ද සිල්වා
ගණිත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

## ABSTRACT

සාහිත්‍ය විද්‍යාව ආදී සියල්ල අවසානයේ දී මිනිසුන්ගේ නිර්මාණ වෙයි. මිනිසුන් නිර්මාණය කරන්නේ යම්කිසි කාල පරිච්ඡේදයක යම්කිසි සංස්කෘතියක ය. ඉතාලියේ ආරම්භ වූ බටහිර පුනරුදය යැයි හැඳින්වෙන ක්‍රියාවලිය හේතුවෙන් බටහිර විද්‍යාව ද බටහිර සාහිත්‍යය ද අනෙක් කලා ශිල්ප ද නිර්මාණය කෙරිණි. ඉතාලියේ ම බිහි වූ ඩාන්ටේ එක්තරා ආකාරයකින් මිචලාංජිලෝ ඩාවිංචි ආදීන්ගේ පුරෝගාමියා ලෙස සැලකිය හැකි ය. එසේ වුවත් බටහිර පුනරුදයේ ආරම්භය පහළොස්වැනි සියවසේ නිර්මාණය කෙරුණු චිත්‍ර හා මූර්ති සමග බැඳී ඇතැයි සැලකෙයි.

බටහිර පුනරුදය යනු බටහිර නූතනත්වයේ මුල් පියවර විය. බටහිර නූතනත්වය කතෝලික චින්තනයෙන් ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට මාරුවීම සමග බැඳී ඇති බටහිර විද්‍යාව ද සාහිත්‍යය ද මේ චින්තන විප්ලවයෙහි ප්‍රතිඵල වියි නව චින්තනය කතෝලික චින්තනයෙන් වෙන් වූයේ ප්‍රධාන වශයෙන් ම වියුක්තිය, පෞද්ගලිකත්වය ඉස්මතු වීම, ඉන්ද්‍රිය පිනවීමට රුකුල්දීම සම්බන්ධයෙනි. කතෝලික චින්තනයෙහි සංයුක්තය, සාමූහිකත්වය හා ඉන්ද්‍රිය පිනවීමට රුකුල් නොදීම වැදගත් වෙයි.

බටහිර නූතනත්වය වර්ධනය වීමත් එහි කේන්ද්‍රය ඉතාලියෙන් එංගලන්තයට මාරුවීමත් සමග බටහිර විද්‍යාව හා තාක්ෂණය පිම් ගණනකින් ඉදිරියට ගියේ ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය තහවුරුවීමත් මිනිසුන් තම තමන්ගේ පෞද්ගලිකත්වයන් ඉස්මතුකර ගැනීමත් මේ අවධියෙහි දක්නට හැකිවිය. ඉඩම් හෙවත් භූමිය සමග මිනිසාගේ තිබූ සම්බන්ධයත් පුද්ගල පුද්ගල සම්බන්ධයනුත් කැඩී ගියේ ය. එහෙත් ඒ සියල්ල සම්පූර්ණ වීමට සියවස් කිහිපයක් ගත විය. මේ යුගයේ බිහිවූ සාහිත්‍යයෙහි මේ සම්බන්ධකම් නැතිවීම නිරූපණය වෙයි.

එංගලන්තයේ පළමුවැනි එලිසබෙත් යුගයෙහි සුචරිතවාදියා හෙවත් පියුරිටන් යන්නෙන් හඳුන්වනු ලැබුවෝ ප්‍රොතෙස්තන්ත ආගම හා සංස්කෘතිය නිසි ලෙස වර්ධනය නොවී යැයි ද පිළිගැනීමට ලක්නොවී යැයි ද යැයි සිතූ අය වූහ. ඔවුන්ට අනුව එදා සමාජයේ පිළිගැනීමට ලක්වූයේ කතෝලික සංස්කෘතිය හා කතෝලික ආගමික ආකල්ප ය. ඔවුන්ට අවශ්‍ය වූයේ ඒ පිළිගැනීම නැතිකර ප්‍රොතෙස්තන්ත ආගමට නිසි පිළිගැනීමක් ලබාදීම ය. එසේ කිරීම දියුණු කිරීමක් ලෙස සැලකිණි. දියුණුව යන්න බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ආගම් වූයේ ප්‍රොතෙස්තන්ත ආගම් බැවින් ඒ ප්‍රවනතාව එසේ ම විය යුතුව තිබුණි.

එහෙත් වික්ටෝරිය යුගය වන විට එංගලන්තයේ සංස්කෘතිය ප්‍රොතෙස්තන්තවාදීන්ට අවශ්‍ය අන්දමට වර්ධනය නොවී තිබිණි. එයට හේතුව වූයේ චින්තන විප්ලවයේ සංස්කෘතික සංරචකය වර්ධනය කරගැනීම සඳහා මතවාද නො තිබීම ය. එලෙස සමාජයේ තහවුරු වූ මතවාද නොතිබි හෙයින් එකල සුචරිතවාදීන් ලෙස හඳුන්වනු ලැබුවෝ එවැනි මතවාද වර්ධනය කිරීමට විරුද්ධ වූවෝ ය. එහෙත් මෙහි සුචරිතවාදියා යන්න යෙදුණේ එක්තරා ආකාරයකින් ගත්කල නින්දාකාරී අර්ථයකිනි. සුචරිතවාදියා යන්නෙන් ගර්හාවට ලක්වූ පුද්ගලයකු හැඳින්විණි. සුචරිතවාදියා දැන් සමාජයට ඉදිරියට යෑමට ඉඩ නොදෙන්නෙක් විය.

වෙනත් වචනවලින් කිවහොත් වික්ටෝරීය සමාජයට, අදාළ සදාචාර සංග්‍රහය කුමක් ද යන්න පිළිබඳ ව නිසි අවබෝධයක් නො තිබිණි. ප්‍රසිද්ධියේ සම්මුතිය වූයේ සමස්තයක් ලෙස ඉන්ද්‍රිය පිනවීමට එරෙහි වූ යම් කතෝලික සදාචාරයකි. එහෙත් ඉන්ද්‍රිය පිනවීමට එරෙහි වූ කතෝලික තහංචිවලට විරුද්ධව යන, පෞද්ගලිකත්වය ඉස්මතු කරන ක්‍රිස්තියානි සංස්කෘතියක් ද විය. එලෙස සම්මුතියට එරෙහිව, එහෙත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට අදාළව පැන නැගුණු සදාචාරය සම්මුතිය බවට පත්කර ගැනීමේ අවශ්‍යතාව සමාජයට විය. ඩී.එච්. ලෝරන්ස් මහතා වැන්නන්ට සිදුවූයේ මේ අවශ්‍යතාව මුදුන්පත් කරගැනීම සඳහා බුද්ධිමය නායකත්වය සැපයීම ය. ලෝරන්ස් මහතා වැන්නවුන් අවසානයේ දී කර ඇත්තේ බටහිර නූතනත්වයට අවශ්‍ය සදාචාරය ගොඩනැගීම සඳහා සාහිත්‍යය ඔස්සේ මතවාද සකස්කිරීම ය.